# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ගණිතය - 3 ශ්‍රේණිය / දෙවන වාරය - ජූලි මාසය - පළවෙනි සතිය


සැකසුම - රත්නපුර අධ්‍යාපන කලාපය

ටී.ඩබ්.නිපුන් කාවින්ද ලීලාරත්න - ර/පුස්සැල්ල මහා විද්‍යාලය

## 21 ඒකකය - සමමිතිය හා රටා

01. ආදරණීය දුවේ පුතේ පළමුව Colour A4 කඩදාසිවලින් කුඩා ත්‍රිකෝණ, වෘත්ත, සමචතුරස්‍ර, සෘජුකෝණාස්‍ර හැඩ 10 බැගින් කපා ගන්න. ඉන් පසු කපා ගත් හැඩතල වර්ග දෙකක් භාවිතයෙන් යම්කිසි රටාවක් ගොඩනගන්න.

උදා:-




ඉන් පසු එක් හැඩතල වර්ගයක් පමණක් භාවිතයෙන් රටාවක් ගොඩනගන්න

උදා:-



ඉහත ආකාරයට හැඩතල වර්ග දෙකක් භාවිතයෙන් සහ එක් හැඩතල වර්ගයක් භාවිතයෙන් රටා කිහිපයක් ගොඩනගා එම රටා A4 කඩදාසියක අලවන්න.


02. සමමිතික රූපයක් නිර්මාණය කිරීම.



- කඩදාසියක් දෙකට නවා එම නැම්ම වටා සරල හැඩයක් ඇඳ කපා ගැනීමට දරුවන්ට උපදෙස් ලබා දෙන්න. කඩදාසිය දිගහැරිය විට හැඩයේ බාග දෙක එකිනෙකට සමාන වන බව නිරීක්ෂණය කිරීමට දරුවන් යොමු කරන්න. මෙහි දී සමමිතික රූපයක් ලැබෙන බව පෙන්වා දෙන්න.
- නැමු රේඛාව සමමිති රේඛාව ලෙස ද හඳුන්වා දෙන්න. සමමිති රේඛාවේ එක් පැත්තක ඇති දෙය අනෙක් පැත්තේ ඇති දෙය සමඟ ගළපා බැලීමට අවස්ථාව දෙන්න.

03. සුදු පාට A4 කඩදාසියක් ගෙන හරි මැදින් දෙකට නවන්න. නැමුම් රේඛාව මතට තීන්ත බින්දුවක් දමා එය හරියට දෙකට නවා සෙමෙන් පිරිමදින්න. ඉන්පසු කඩදාසිය දිග හැර බලන්න. අලංකාර සමමිතික රූපයක් ලැබී තියේවි.

04. පහත සමමිතික හැඩතලවල සමමිතික රේඛා කොපමණ තිබේ ද ?(සමමිතික රේඛා ඇඳිමින් නම් කරන්න)



05. ඔබේ ගණිතය වැඩ පොතෙහි 11, 12, 13 පිටුවල ඇති සමමිතිය හා රටා පාඩමෙහි අභ්‍යාස සිදු කරන්න.